www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය, චීනය හා ශ්‍රී ලංකාවේ යුද්ධය

## US, China and the war in Sri Lanka

**2009 මාර්තු 24**

ශ්‍රී ලංකාවේ යුද්ධය පිලිබඳව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල, එක්සත් ජනපදය හා චීන රාජ්‍යතාන්ත්‍රිකයින් අතර හටගෙන ඇති ආරෝව ලෝකයේ අස්සක් මුල්ලක් නැර වර්ධනය වන ඔවුන්ගේ එදිරිවාදීකම් පෙන්නුම් කරන්නේ ය. දිවයින තුල 25 වසරක යුද්ධය, එහි අවසන් අදියරට සේන්දු වෙමින් තිබියදී බලවතුන් දෙදෙනාම තම උත්සුකයන් කොලඹ ආන්ඩුව හමුවේ තැබීමට අදිටන් කර ගෙන සිටිති.

පසුගිය සතියේදී, එක්සත් ජනපදයේ හා බ්‍රිතාන්‍යයේ පිටුබලය සහිතව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයෙහි සාමාජිකයන් වන ඔස්ට්‍රියාව, මෙක්සිකෝ හා කොස්ටා රිකාව, ශ්‍රී ලංකාවේ උතුරේ යුද්ධයෙන් කොටුවී සිටින දසදහස් ගනන් මිනිසුන් මුහුන දෙන මානුෂික අර්බුදය පිලිබඳව නිල නොවන සාකච්ඡාවක් කැඳවීය. රුසියාවේ ද සහයෝගය ඇතිව චීනය, එය ශ්‍රී ලංකාවේ ''අභ්‍යන්තර ප්‍රශ්නයක්'' මිස ජාත්‍යන්තර ආරක්ෂාවට තර්ජනයක් නොවේයයි ප්‍රකාශ කරමින් එම උත්සාහය වැලැක්වීය.

මෙම රාජ්‍යතාන්ත්‍රික උපාමාරු කිසිවක් මතුපිටින් පවතින තත්වයෙන් නොගත යුතුය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ ග්‍රහනය යටතේ ඉතිරිව ඇති කුඩා බිම්කඩ වෙත ශ්‍රී ලංකා හමුදාව සමීප වෙමින් සිටියදී, ගැටුමට මැදිවී සිටින දසදහස් ගනන් සිවිල් වැසියන්ගේ ඉරනම පිලිබඳව, හදිසියේම වොෂින්ටනයේ කනස්සල්ල පලවෙමින් තිබේ.

එක්සත් ජනපද මාධ්‍යය ද දැන් එම බෝට්ටුවේම පදිමින් සිටියි. නිදසුනක් ලෙස *නිව් යෝර්ක් ටයිම්ස්* ''සාමයට ඇති අභියෝග'' හා සරනාගතයන්ගේ ඉරනම පිලිබඳව ලිපියක් ඉරිදා පත්‍රයේ පල කලේය. ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති රොබට් බ්ලේක්, ආන්ඩුව ''නිශ්චිත දැඩි මතධාරී සිංහල බලවේගයන්'' විසින් ග්‍රහනයට ගෙන තිබීම ගැන සිය නොසතුට පලකල අතර ''දෙමල හා මුස්ලිම් ජනකොටස් වෙතට'' දෑත් දිගු කරන ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂගෙන් ඉල්ලා සිටියේ ය.

2007 වසරේ මැද භාගයේ සිට හමුදාවේ දැඩි පාලනය යටතේ පවතින දිවයිනේ නැගෙනහිර පලාත තුල ඇති ''සීතල සාමය'' ගැන ලිපිය අවධානය යොමුකර තිබේ. මඩකලපුව ''නගර මධ්‍යයේ හමුදා මුර කපොලු පිහිටුවා තිබුන ද පසුබිමේ සැරිසරන සන්නද්ධ මැරයන් විසින් සිදු කරන පැහැරගෙනයාම් හා අතුරුදහන් කිරීම් පිලිබඳව දිගටම වාර්තාවේ.''

ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, එවන් පොලිස් රාජ්‍ය පියවර සුජාත කරමින් කියා සිටියේ ''යුද්ධය වනාහි පිලිකාවක් වැනි දෙයකි. පිලිකාවකට ප්‍රතිකාර කිරීමෙන් පසුවත් විද්‍යුත් කිරන අනුසාරයෙන් කරන ප්‍රතිකර්ම සඳහා කාලයක් අවශ්‍යය. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය සම්බන්ධයෙන් ද තත්වය එය ම වෙයි.''

කෙසේ වුව ද මෑතක් වන තෙක්ම එක්සත් ජනපදය, මහින්ද රාජපක්ෂටත්, යුද්ධයට මෙන්ම මිලිටරිය විසින් අමු අමුවේම සිදු කල ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීමටත් සම්පූර්න පිටුබලය සැපයීය. එහෙත් ජනවාරි මුල්භාගයේ පටන් එල්ටීටීඊයේ ඉතිරි භූමිභාගයන් වෙත හමුදාව වේගයෙන් කඩාවදින විටත්, එල්ටීටීඊයේ පරාජය නියත බව පෙනීයන විටත්, එක්සත් ජනපදය, උපායාත්මක වෙනසක් ගත්තේය. ගැටුමට දේශපාලන විසඳුමක් ගැන ඔවුන් කථා කිරීමට පටන් ගත් අතර ඒ, එල්ටීටීඊ සමඟ නොව, යුද්ධය පැනනැඟීමට තුඩු දුන් දශක ගනනාවක් පැවති දෙමල විරෝධී නොපනත්කම්වලින් කම්පාවට පත්ව සිටින දෙමල ප්‍රභූ කොටස් සමඟ, ඔවුන් සන්සුන් කිරීමේ සම්මුතියක් සඳහා ය.

වොෂින්ටනයේ උත්සුකය දැල්වී ඇත්තේ, වර්ධනය වෙමින් ඇති වාර්ගික ආතතීන් ශ්‍රී ලංකාව පමනක් නොව, දකුනු ආසියාව තුල ඇමරිකාවේ ප්‍රමුඛ ආර්ථික හා මූලෝපායික සහකරුවා බවට පත්ව සිටින අසල්වැසි ඉන්දියාව ද අස්ථාවර කරනු ඇතැයි යන්න පිලිබඳවය. නව දිල්ලිය කනස්සල්ලට පත්ව සිටින්නේ, ශ්‍රී ලංකාව සමඟ ඓතිහාසික බැඳීම් සහිත දකුනේ තමිල්නාඩු ප්‍රාන්තයෙහි දෙමල වැසියන් කරා ද දේශපාලන අසහනය පැතිර යාමේ හැකියාව පිලිබඳව ය. ''මානුෂික'' ප්‍රශ්නය මතුකර ඇත්තේ, සහන ලබාගැනීම සඳහා රාජපක්ෂ තන්ත්‍රයට බලපෑම් කිරීමේ මාධ්‍යයක් ලෙසය.

ශ්‍රී ලංකාව තුල චීනයේ බලපෑම වර්ධනය වීම ද එක්සත් ජනපදයට හා ඉන්දියාවට හිසරදයක්ව ඇති තවත් පොදු කාරනයකි. ශ්‍රී ලංකාවේ යුද්ධයට සහයෝගය දීමේදී ප්‍රවේසම් වීමට ඉන්දියාවට සිදුව ඇති තත්වය හමුවේ චීනය, කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව ම කොලඹ ආන්ඩුවට මිලිටරි හා මූල්‍යාධාර

සපයා තිබේ. ප්‍රහාරක ගුවන්යානා, නවීන රේඩාර් පද්ධති, ගුවන්යානා නාශක අවි, අනෙකුත් මිලිටරි මෙවලම් හා යුද්ධෝපකරන ඇතුලු චීනයේ අවි වෙලඳම, රටේ දිග් ගැස්සුනු සිවිල් යුද්ධය ජයගැනීම සහතික කරන සාධකයක් බවට පත්ව තිබේ. පසුගිය මාසයේ චීනයේ සංචාරයක යෙදෙමින් ආරක්ෂක ලේකම් රාජපක්ෂ, ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' ශක්තිමත් කරමින් ලැබුනු ''දිගු කාලීන සහයෝගය'' පිලිබඳව එරටට තුති පුද කලේය.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල සාකච්ඡාව අවහිර කිරීමට චීනය ගත් තීරනය, ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය විසින් ද සාදරයෙන් පිලිගනු ලැබිනි. ''ශ්‍රී ලාංකික සංක්‍රමනිකයන් හා 'ශෝකයට පත් හදවත්' ඇති ජාත්‍යන්තර කන්ඩායමක් විසින් යොදන ලද දැඩි බලපෑම් හමුවේ, බටහිර රටවලින් යෙදෙන පීඩනය ගැන සඳහන් කල පසුගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් කතුවැකිය, වර්ධනය වන බලපෑම් හෙලා දැක තිබුනි. ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේදී ශ්‍රී ලංකාවේ දිගුකාලීන මිතුරා වන චීනය, එක්සත් ජාතීන්ගේ එම පියවර බිඳ දමා තිබේ.'' යනුවෙන් එය තවදුරටත් ප්‍රකාශ කලේය.

එක්සත් ජනපදය මෙන්ම චීනය ද එක්සත් ජාතීන්ගේ මන්ඩලය තුල යොදන උපාමාරු සඳහා මග හෙලිකරන්නේ එම රටවල ම අවශ්‍යතාවන්ගෙනි. බීජිනය සිය ''අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමේ'' මූලධර්මය, එක්සත් ජනපදයේ ඇෆ්ගනිස්ථාන හා ඉරාක මැදිහත්වීම්වලට පැමිනි කල, පහසුවෙන් ම අමතක කර දැමීය. ශ්‍රී ලංකාව පිලිබඳ ප්‍රශ්නයේ දී චීනය, එක්සත් ජාතීන්ගේ විවාදය අවහිර කරමින් කොලඹ ආන්ඩුවටත් එහි සාපරාධී යුද්ධයටත් එය ලබාදෙන කොන්දේසි විරහිත සහයෝගය ආරක්ෂා කිරීම මගින්, කොලඹ හොඳ හිත දිනාගැනීම පිනිස එම කුතර්කය යොදාගත්තේය.

බීජිනයට ලැබුන වාසිය, දකුනේ හම්බන්තොට නගරයෙහි ප්‍රධාන වරායක් ඉදිකිරීම සඳහා 2007 වසරේදී ආන්ඩුව සමග එලඹුන ඩොලර් බිලියනයක් වන ගිවිසුමයි. චීන සමාගම් හා ප්‍රධාන කොටම චීන අරමුදල්වලින් ඉදිකෙරෙන ව්‍යාපෘතියේ ප්‍රථම අදියර වසර 2010 අවසන දී නිමකිරීමට නියමිතය. නිමවූ පසුව එය, කන්ටේනර් අංගනයක්, බහාලුම් අංගනයක්, තෙල් පිරිපහදුවක්, ගුවන් තොටුපලක් හා අනෙකුත් පහසුකම්වලින් යුක්ත වන අතර, හම්බන්තොට ප්‍රමුඛ ප්‍රති නැව්ගත කිරීමේ සංකීර්නයක් බවට පත්කිරීමට අපේක්ෂිත ය.

චීනයට මෙම ව්‍යාපෘතියේ ඇති වැදගත්කම පැහැදිලිය. ශ්‍රී ලංකාවේ දකුනු තුඩුවෙහි ඇති හම්බන්තොට සිට ඉන්දියන් සාගරය හරහා නැගෙනහිර සිට බටහිරට දිවෙන ප්‍රධාන වෙලඳ මාර්ගයට ඇත්තේ නාවික සැතපුම් හයක් පමනි. චීනයට නැව්ගත කෙරෙන තෙල් ආනයනයන්ගෙන් සියයට 70 පමන මැදපෙරදිග සිට මලක්කා සමුද්‍ර සන්ධිය හරහා චීන වරායන් වෙත ලගාවන්නේ මෙම මුහුදු මාර්ගය ඔස්සේය. සිය නාවික ප්‍රවාහනය ඕනෑම ගැටුමකට, විශේෂයෙන්ම එක්සත් ජනපදය සමග, නිරාවරනයව ඇති බව හොඳින්ම වටහාගෙන ඇති බීජිනය, ''මුතු මාලය'' ලෙස හඳුන්වන මෙම වෙලඳ මාර්ගය දිගට ඇති වරායන් සංවර්ධනය කිරීම හා සිය නාවික හමුදාව පුලුල් කිරීම සඳහා පියවර ගෙන ඇත. චීනය විසින් ඉදිකල පකිස්ථානයේ ග්වාඩාර් වරාය මෙන්ම හම්බන්තොට ද එක් මුතු ඇටයකි.

එක්සත් ජනපදය හා ඉන්දියා අභිප්‍රාය මෙම චීන මූලෝපාය වෙත ප්‍රතිප්‍රහාරාත්මකව සූදානම් වෙති. මානුෂික දූතමෙහෙවරක රැවටිල්ල යටතේ ඉන්දියාව, ශ්‍රී ලංකාව වෙත හමුදා වෛද්‍ය කන්ඩායමක් පිටත් කර හැර තිබේ. මෙම මස මුලදී සරනාගතයන් ඉවත් කිරීම සඳහා එක්සත් ජනපදය, නාවික ගවේෂන සේනාංකයක් ශ්‍රී ලංකාව් උතුරු ප්‍රදේශයට පිටත්කර හැරීම සඳහා යෝජනාවක් - දැනට ප්‍රතික්ෂේප කර ඇති බවක් පෙනී යන - කර තිබේ.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල සිදුවූ රාජ්‍ය තාන්ත්‍රික කඹ ඇදීම මෙන්ම, එකදු පාර්ශවයක් මගින් හෝ ගන්නා මෙම පියවර, 25 වසරක සිවිල් යුද්ධයේ බරට කරගැසීමට සිදුව ඇති ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාව පිලිබඳ උත්සුකයකින් අභිප්‍රෙරනය වන්නේ නොවේ. ගෝලීය ආර්ථික අර්බුදය ගැඹුරුවෙද්දී, උග්‍ර අතට හැරෙමින් තිබෙන ජාත්‍යන්තර එදිරිවාදිකම් තුලට ඇද දමා ඇති හා තවත් ව්‍යසනකාරී ගැටුම්වල හෙවනැල්ල යට පවතින, ලෝකයේ අනෙක් කොටස් අතරට දකුනු ආසියාවේ කුඩා දිවයිනක් වන ශ්‍රී ලංකාව ද වැටී ඇත.

**පීටර් සිමන්ඩ්ස්**

© www.wsws.org